**(300,000.00 – 500,000.00)**

ගිවිසුම් පත්‍රය

1978 අංක 16 දරණ පනතේ ප්‍රතිපාදන යටතේ පිහිටුවන ලද උසස් අධ්‍යාපන ආයතනයක් වන කැලණිය දළුගම පිහිටි කැලණිය විශ්වවිද්‍යාලයය (මෙයින් මතු විශ්වවිද්‍යාලය යනුවෙන් හඳුන්වන ලබන) එක් පාර්ශවයක් වශයෙන්ද ........................................................................................ හි පදිංචි ........................................................................................................................මෙයින් මතු එකී ආචාර්යවරයා යනුවෙන් හඳුන්වන ලබන අනෙක් පාර්ශවයටද බැඳී දෙපාර්ශවය අතර ඇති කර ගන්නා ගිවිසුමයි.

එකී විශ්වවිද්‍යාලය මගින් එකී විශ්වවිද්‍යාලයේ සේවය කරන ආචාර්යවරුන්ගේ පර්යේෂණ කටයුතු සඳහා මුල්‍ය ආධාර ලබා දීමේ වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කර ඇති හෙයින්ද, එකී වැඩපිලිවෙල යටතේ එකී ආචාර්යවරයාට ..........................................................................................................................

..............................................................................................................................................

පිළිබඳ පර්යේෂණයක් (මෙයින් මතු එකී පර්යේෂණය යනුවෙන් හඳුන්වන ලබන) සඳහා මුල්‍ය ආධාර ලබා දීමට එකී විශ්වවිද්‍යාලය තීරණය කර ඇති හෙයින්ද,

මීට පාර්ශවකරුවන් වශයෙන් බැඳී ඇතිකරගන්නා ගිවිසුම් පහත සඳහන් අකාර වේ.

1. මෙම ගිවිසුම .......................... දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වන සේ සැලකිය යුතුය.

2. එකී පරීක්ෂණය සඳහා ආධාර වශයෙන් විශ්වවිද්‍යාලය විසින් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රු. 300,000/= මුදලක් මුල් අවස්ථාවේදී එකී ආචාර්යවරයාට ගෙවනු ලැබේ. අනතුරුව එකී පර්යේෂණයේ සාර්ථකත්වය සඳහා මුල්‍යමය ආධාරයේ වැදගත්කම හා පර්යේෂණයේ ප්‍රගතිය සලකාබලා සම්පූර්ණ මුල්‍යමය ආධාරය ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් ලක්ෂ පහ සීමාවට යටත්ව ඉතිරි මුදල වන ........................................................ ක මුදලක් එකී ආචාර්යවරයාට ගෙවනු ලැබේ.
3. එකී ආචාර්යවරයා මෙම ගිවිසුමෙහි සඳහන් දින සිට පර්යේෂණ ව්‍යාපෘතියේ කාලසීමාව වසර ................................ ක් ගතවන .............................. දිනට හෝ හේතු සහිතව කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව දීර්ඝ කරගත් කාලය ඉක්මයාමට හෝ පෙර මෙම පර්යේෂණය නිම කලයුතු අතර, එකී ආචාර්යවරයා විසින් ලබා ගන්නා ලද පර්යේෂණ අත්තිකාරම් මුදල් සඳහා බිල්පත්,කුවිතාන්සි සහා වියදම් වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කල යුතුය.

4. 300,000.00 – 500,000.00 අතර පර්යේෂණ ව්‍යාපෘතිවල සොයාගැනීම් සම්පූර්ණ වාර්තාවක් ලෙස සඟරාවක පල කළ යුතු අතර නැවත පර්යේෂණ සඳහා අයදුම්පත් යොමු කිරීමේදී එය සලකා බලනු ලැබේ.

5. එකී ආචාර්යවරයා විසින් ලබා ගන්නා ලද පර්යේෂණ අත්තිකාරම් මුදල් වියදම් කිරීමෙන් පසු ඉතිරි මුදලක් වෙතොත් ඒ පර්යේෂණය වෙනස් වී සති 2ක් ඇතුලත විශ්වවිද්‍යාලයට ආපසු ගෙවනු ලැබිය යුතුය.

**(300,000.00 – 500,000.00)**

6. එකී ආචාර්යවරයා එකී පර්යේෂණ අත්තිකාරම් මුදල් ලබා ගෙන මාසයක් ඇතුලත අදාල පර්යේෂණය ආරම්භ කලයුතු අතර එසේ නොකලහොත් සම්පූර්ණ මුදලම විශ්වවිද්‍යාලයට ආපසු ගෙවිය යුතුය. එසේ ගෙවීම පැහැරහරිනු ලැබුවහොත් විශ්වවිද්‍යාලය මගින් නියම කරනු ලබන පරිදි එකී ආචාර්යවරයාගේ වැටුපෙන් හෝ විශ්වවිද්‍යාල අර්ථසාදක අරමුදලෙහි ඔහුගේ බැරට ඇති ශේෂයෙන් එකී සම්පූර්ණ මුදලම අයකර ගැනීම සඳහා අර්ථසාදක අරමුදලේ ශේෂය ප්‍රමාණවත් නොවේ නම් එකී මුදලෙන් කොටසක් හෝ අයකර ගැනීමට එකී ආචාර්යවරයා සිය එකගත්වය ප්‍රකාශකර සිටී
7. එකී පර්යේෂණය සඳහා ආධාර මුදලින් ප්‍රතිපූර්ණය කිරීමේ බලාපොරොත්තුවෙන් පෞද්ගලික මුදල් වැය නොකල යුතු අතර එකී මුදල් වැයකිරීමේදී එකී ආචාර්යවරයා විශ්වවිද්‍යාලයේ මුදල් හා පරිපාලන නීතී වලට අනුව කටයුතු කල යුතුය.

8. එකී ආචාර්යවරයා විසින් එකී පර්යේෂණය සිදු කරනු ලබන කාලය තුල සයමසකට වරක් නිසි පරිදි ප්‍රගතිවාර්තා එවිය යුතු අතර, පර්යේෂණ වාර්තාවක් පිටපත් 3කින් ජේදයෙහි සඳහන් .................................... දින සිට යලිත් මාස 3ක් ඉක්මයාමට පෙර භාරදෙනු ලැබිය යුතුය.එකී පර්යේෂණ කටයුතු අවසන් කර දින 30 ක් ඉක්මයාමට පෙර සියලු මුදල් පිළිබඳ ගිණුම් වාර්තා ඉදිරිපත් කල යුතුය.එකී ආචාර්යවරයා විසින් පර්යේෂණය සඳහා ප්‍රථම වාරිකය ලබාගත් පසු ඉලග වාරිකය සඳහා ඉල්ලුම් කිරීමේදී නිසි පරිද වාර්ථා ඉදිරිපත් කල යුතුය.

9. එකී ආචාර්යවරයා විශ්වවිද්‍යාල නිතීරිතී වලට සහා පර්යේෂණ ආධාර ලබා දීමට අදාල නිමයන්ට අනුකූලව කටයුතු කල යුතුය.

10. කිසියම් ආකාරයකින් කුමන හේතුවක් මත හෝ යෝජිත පර්යේෂන වාර්තාව විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට එකී ආචාර්‍යවරයා අපොහොසත් වන්නේ නම් ඔහු වෙත ප්‍රධානය කරන ලද පර්යේෂණ ආධාර මුදල් විශ්වවිද්‍යාලය විසින් එකී ආචාර්යවරයාගේ වැටුපෙන් හෝ විශ්වවිද්‍යාල අර්ථසාදක අරමුදලින් ඔහුගේ බරට ඇති ශේෂයෙන් අයකර ගැනීම පිළිබඳව එකී ආචාර්යවරයා එකග වේ.

11. අවශ්‍ය අවස්ථාවලදී පර්යේෂකවරයා විසින් තම අධ්‍යයනය සම්බන්ධයෙන් ආචාරධර්ම සමාලෝචනයක් සිදු කිරීමට එකග වේ.

12. ඡේද අංක 03 හි සඳහන් දිනය වන විට පර්යේෂණ ව්‍යාපෘතිය අවසන් කර නොමැති නම් අදාල පර්යේෂකවරයා විසින් පර්යේෂණ කාලය දීර්ඝ කර ගැනීම සඳහා ඉල්ලීමක් සිදු කළ යුතු ය. එහිදී අනුමත පර්යේෂණ කාලය මෙන් දෙගුණයක් නොඉක්මවන සේ හා උපරිමය වසර 05කට යටත්ව (අනුමත පර්යේෂණ කාලයද ඇතුලුව) පර්යේෂණ කාල සීමාව දීර්ඝ කිරීම සිදු කරනු ලැබේ.

13. පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා දීර්ඝ කරන ලද කාලය අවසන් වන විට ව්‍යාපෘතිය අවසන් කර නොමැති වුවද අදාළ ව්‍යාපෘතිය සම්බන්ධ අවසන් වාර්තාව සම්පූර්ණ ගිණුම් වාර්තාවක් සමග ව්‍යාපෘතියේ කාලසීමාව අවසන් වන දින සිට මාස 03ක් ඇතුලත ඉදිරිපත් කළ යුතුය.

14. පර්යේෂණ කාලසීමාව අවසන් වන විට අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් එය ගිවිසුම් කඩ කිරීමක් ලෙස සැලකෙන අතර, පර්යේෂණ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන දින සිට අවම වසර 03ක කාලයක් දක්වා විශ්වවිද්‍යාලයෙන් දෙනු ලබන කිසිදු පර්යේෂණ ප්‍රදානයක් සඳහා සලකා බලනු නොලැබේ.

**(300,000.00 – 500,000.00)**

15. පර්යේෂණ ව්‍යාපෘතිය පදනම් කරගෙන සගරා මුද්‍රණය කිරීමේදී ඒ සඳහා පර්යේෂණ ප්‍රතිපාදන ලබා ගත් බව සඳහන් කළ යුතු ය.

16. පර්යේෂණ ව්‍යාපෘතියේ වැඩ කටයුතු කරගෙන යාම මාස 06ක් හෝ ඊට වඩා වැඩි කාලයක් අතපසු වුවහොත් ඒ සඳහා තාවකාලික පර්යේෂකවරයෙක් නම් කිරීමට අදාල පර්යේෂකවරයා අනිවාර්යයෙන් කටයුතු කළ යුතු ය.

17. කිසියම් ආකාරයකින් එකී ආචාර්යවරයා විශ්වවිද්‍යාලයෙන් විශ්‍රාම ගන්වනු ලැබීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ එකී පර්යේෂණ කටයුතු සිදු කිරීමට නොහැකි වන්නේ නම් එකී ආචාර්යවරයා වෙත ප්‍රධානය කරනු ලබන පරික්ෂණ ආධාර මුදල විශ්වවිද්‍යාලයට අයවිය යුතු මුදලක් සේ සලකා විශ්වවිද්‍යාලයේන් එකී ආචාර්යවරයාට හිමිවිය යුතු ප්‍රතිලාබ වලින් අඩු කරගනු ලැබීමට එකී ආචාර්යවරයා එකඟ වේ.

ඊට සාක්ෂි පිනිස එකී පාර්ශවකරුවන් විසින් මෙයට හා මේ හා සමාන තවත් එක් ලේඛනයකට වර්ෂ ......................... ක් වූ .............. මස .............දින අත්සන් තබන ලදී.

.......................................... ..........................................

ආචාර්යවරයා (කැලණිය විශ්වවිද්‍යාලය වෙනුවෙන් බලයලත් නිලධාරී)

සාක්ෂි ඃ

1.නම ඃ

අත්සන ඃ

2. නම ඃ

අත්සන ඃ

සාක්ෂි ඃ

1.නම ඃ

අත්සන ඃ

2.නම ඃ

අත්සන ඃ

Recommended At R & P Meeting No 2024/01, Senate meeting No 384 & 524th meeting of the Council.